


වෛද්‍ය බෝධිනී සමරතුංග

# කිරි දොවලා දෙන්න මිස් නිතර ඇසු දුටු කඳුළු...

**කොරිඩෝවේ සිටියේ ඇය ය. මා සොයමින් සිටි බවක් කියයි. "මොකෝ මාව හොයන්නේ?" "අනේ ඩොට්ටර් කිරි දොවලා දෙන්න"**

ඇය හැමෝටම ආමන්ත්‍රණය කරන්නේ ඔහොමය. ඔය කියන දවසට පෙරේදා හවස හදිසියේ රෝහල් ගතවුණු මේ අම්මා අඩුම අඩු බර බිළිඳියක ප්‍රසූත කළාය. පෙරේදාට කළින් දා, රෑ සිට ප්‍රසව වේදනා සමග වතුර යන්න පටන් ගත්තාට කිසිවෙක් කියන දෙයක් වගේ වගක් නොකර හිතුමතේ ගෙදරට වී උන් ඇය පසුවදා කුදලාගෙන රෝහලට ගෙනැවිත් තිබුනේ නැන්දම්මා ය. ඕ තරම්ම අඩු සමාජ දැනුම ද බුද්ධි හීනතාවද ඇගෙන් පෙන්නුම් කරයි. ඇයද ස්නායු රෝග තත්වයකින් පෙලේ. දරුවා දැන් සිටින්නේ, අප හදිසියේ අටවා ගත් වීදුරු කාමරයේ ඉන්කියුබේටරයේ ය. පැය 18 කට ආසන්න කාළයක් ඇම්නියෝටික තරලය පිටතට කාන්දුවෙද්දී ගෙදර සිටි හෙයින්, දරුවාට ආරක්ෂාව සලකා, ප්‍රතිජීවක ඖෂධ එන්නත් කරයි. ඔක්සිජන් සම්බන්ධ කරන නාල නහය අසලට සවි කර තිබෙන්නේ,හුස්ම ගැනීමේ අපහසුතාව නිසා ය.

පෙරේදාට කළියෙන් අම්මා උන්නේ ප්‍රසව වාට්ටුවේ ය. දරුවා අප වාට්ටුවේ වීදුරු කූඩුව තුල ය. අම්මාට ඇවිත් යා හැකිය. එහෙත් ඇය දැඩි ව්‍යාකූල බවකින් සිටියා ය. අප ඇය එහි හිඳුවා දරුවා ඔතා ඇයට දුන්නේ කිරි දීමට ය.

"කිරි එන්නෑ" කියමින් ඇය කිරි දීමට අදි මදි කරයි. බොහෝ කල් අරන් විවිධ අයුරින් කිරි මිස් නමින් හඳුන්වන මව් කිරි දීම පිළිබඳ උපදේශනය සිදු කරන හෙදියද දැඩි වෙහෙසක් දරන්නේ ඇයට සහ දරුවාට නිසි ලෙස මව් කිරි දීගත හැකි ලෙස සම්බන්ධ කිරීමටයි.

අවසන සියලු උපදෙස් ගඟට කැපූ ඉනි මෙන් විය. දොව දොවා කිරි දෙන ලෙස උපදෙස් ලැබිණි. කියා දී කරන්නේ නැති තැන මිස්ලා මහන්සිය නොබලා තමන්ම දොවාගෙන අර දරුවාට කිරි පෙව්වෝය. මගේ වැඩ මුරය වෙලාවේ මම හිතුවේ කො හොම හරි කියා දෙනව කියලා ය. ඕ වෙද්දි, මන්ද මානසික දරුවන්ට පවා යම් යම් දේ කියා දී මගේ ආත්ම ශක්තිය ඕ ගැන බො හොම ඉහළ තැනක තිබුනාය.

වැඩි හොඳට ග්ලවුස් දෙකක් දමා,(බිළිඳා අඩු බර නිසා රෝග බෝවීමට වැඩි අවධා නම් ඇති නිසා) මගේ අතින්ම දරුවා අල්ලා ගෙන දරුවා සහ මව කිට්ටු කරගෙන , නි වැරදි ලෙස ස්ථාපනය කරන හැටි, ඉරියව්, සහ ක්‍රමවේද බොහොම ආදරෙන් කියා දුන්නේ, පුතේ පුතේ කියමිනි. මොකද ඇය තවම දහ නම වියැති පොඩි එකෙක් වගේ හිතන අම්මෙක් නිසා.
"දැන් හරි වැඩේ, ඔන්න මං කියා දුන්නා" යැයි කියමින් මම ජයග්‍රාහී අයුරින් ආවෙමි. මගේ උත්කර්ෂවත් බැලූම පුපුරා යන්නට ගතවුනේ මිනිත්තු කිහිපයකි.

"බොන්නෑ මිස්" නැවත ඇය වැරදි ඉරියව්, වැරදි ක්‍රමවේද සහිතව බෙරිහන් දෙන ළදරුවා ඔසවාගෙන අප සහය පතයි.

අන්තිමේ මට වුනේ ඇයට කිරි දොවා දීමටයි. දොවා දුන් කිරි ටික ඉන්කියුබේටරයේ සිට රැහැයියෙක් මෙන් අඬන දරුවාට පොවා දරුවා නළවන්නට සනසන්නට වුනේ අප හෙදියන් ටය. අම්මාට එහෙමවත් හැඟීමක් නොවී ය.

ඊළඟ කිරිවේල දොවා ගන්නට බැරුව මාව හොයාගෙන වාට්ටුව පුරා ඇවිද්ද අම්මාට අන්තිමේ  අපි දොවා දෙනවා වෙනුවට හෙමි හෙමින් එයාම දොවා ගන්නා තැනට එනකම් ඕ අම්මාව ඕ දේ කරන්න යොමු කළා නැත්නම් එයා පුරුදු වෙන්නෙම නැති නිසා. පස්සේ අපි ආච්චිව ගෙන්නගෙන එයාට පුරුදු කළා.

කෙසේ හෝ ඇය සුව වී ඇගේ දරුවාත් සුව වී ගෙදර ගියෝය. විටින් විට ආවෝ ය. සායනයට ද එන්නට දින නියම කර දුන්නෙමු. අපේ සායනයට ආ විට අතින් අල්ලාගෙන ගොස්, ප්‍රසව හා නාරිවේද සායනයේ වෛද්‍යවරයා හමුවී ඔවුන්ගේ තත්වය සහ මවගේ රෝගී තත්වය ගැන දන්වා ඇයට අවශ්‍ය උපත් පාලන ක්‍රමයක් සකස් කර දෙන ලෙස ද පැවසූවෙමු. එහෙත් ඇයට ඕ සියල්ල මග හැරී තිබුනි. ඕ දෛවය යැයි මට සිතේ.

ඉන්පසු ඇය දැක්කේම නැත. කාලෙකින් නැවත අප සොයාගෙන පැමිණියා ය. "මිස් බබාට උණ, කන්නෙ බොන්නේත් නෑ." අප දුටුවේ ඇය යළිත් ගැබිණියක බවයි.

ඇයට පසුගිය මාස් ශුද්ධිය ඇතිවූ දිනයක් ගැනවත් නිච්චියක් නැත. දැන් තියෙන්නේ මේ ඉන්නා අවුල ලිහා ගැනීම ය.

දැන් දරුවාගේ රෝගී තත්වය ගැන එකින් එක මම විමසමින් සිටියෙමි.

"දරුවා සෑහෙන්න දුර්වලයි වගේ. මේ බරත් අඩුයි අම්මා. මොනවද කන්න දෙන්නේ. ?"
"උදේට බත් දෙනවා... " ඇය කියන්නට පටන් ගනිද්දීම ඇගේ නැන්දම්මා පැවසුවේ ඇය පිස යන අහර ටිකවත් දරුවාට කවා ගන්නේ නැති බවයි.

දවස තිස්සෙම පිටි කිරි දියකරමින් දරුවාගේ කුස පුරවන මේ අම්මා, මන්ද මානසික තත්වය නිසාම එසේ කරනවා විය හැකියි. අපි දින ගණන් වෙහෙසිලා, අම්මාටත් ආච්චීටත් උගන්වා මව් කිරි දීමටත් මව් කිරි දොවා දීමටත් වූ වෙහෙස ගඟට කැපූ ඉණි ලෙස දිය කර හරින්න, ඔවුන්ගේ හංදියේ ඩිස්පැන්සරියේ දොස්තර කෙනෙක් සමත් වී තිබුනා. ඕ මාස තුන හතරෙන්ම දරුවා අඬනවා කියමින් එහි ගිය ඔවුන්ට පිටි කිරි ලියා දීමෙන්.
මව් කිරි දිය හැකිව තිබියදී මොවුන් තම ආර්ථික අපහසුතා සහ ජීවන අර්බුද වලට තවත් කරදරයක් එක් කරගනිමින් තවත් සල්ලි වියදම් කරමින් කිරි පිටි දෙන්නට පටන් ගෙන තිබුනි. මව් කිරි දීම ප්‍රචාරණය කරන්නට විශාල ක්‍රියාවලීන් පවුල් සෞඛ්‍ය කාර්‍යාංශය මගින් ගෙන යයි. එය ප්‍රචාරණය කරන්නට, පවත්වාගෙන යන්නට, වෛද්‍යවරුන්, හෙදියන් , පවුල් සෞඛ්‍ය සේවිකාවන් පුහුණු කරති. එහෙත් ඕ මහන්සිය වතුරේ යවමින් ඔවුන් කෙටි පාරවල් සොයා ජීවිතේට තවත් කරදර එකතු කර ගනිති.

මේ අම්මා රැකියාවක් නොකරයි. ඉන්නේ ලෑලි ගෙවල් වලින් පිරි, අනවසර ප්‍රදේශයක පිහිටි මුඩුක්කු පරිසරයක ය. ඔවුන්ට විදුලිය පවා නොමැත. සැමියා කුලී වැඩ කරයි. නැන්දම්මාද කුලී වැඩ කරයි. එතකොට ඔවුන් සෑහෙන ප්‍රමාණයක මුදල් කිරි බෝතල් සහ කිරි පිටි සඳහා වියදම් කළ යුතුයි. අපි මාසයක් තිස්සේ මතුරපු මන්ත්‍රණය ඔවුන්ට තේරෙන්නේ නැත. ඔවුන් සිතන්නේ කුමකින් හෝ හඬන දරුවාගේ බඩ පිරෙව්වොත් හරි කියා ය. ඉන් ළදරුවාගේ අභ්‍යන්තර ඉන්ද්‍රිය වලට වෙන වෙනස්කම් ගැන කියවන්නේ නැත. දන්නේ නැත. ලෙහෙසිය පමණක් බලයි. මව් කිරි වලින් දරුවාට ලැබෙන ආරක්ෂාව හෝ පෝෂණය ගැන වැටහීමක් නැත. දරුවා බොහෝ රෝග වලින් මුල් කාලයේ ආරක්ෂා කරන්නේ මව් කිරි ඔස්සේ දරුවාට ලැබෙන ප්‍රතිදේහ මගිනි. ප්‍රතිශක්තිකරණය සඳහා එය වඩා වැදගත් ය. එමෙන්ම එයින් දරුවා සහ මව අතර සම්බන්ධතාව වැඩි කරයි. දරුවා පසු කාලීනවද බොහෝ රෝග වලින් ආරක්ෂා කරයි. මවගෙන් ළදරුවාට කෙළින්ම දිය හැකි නිසා, ඇසුරුම් වල බහා දීම තැම්බීම මගින් ඕ ඇසුරුම් ජීවානුහරණය කිරීම සිදු කළ යුතු නොවේ එනිසා බොහෝ ආහාර ජීර්ණය සම්බන්ද රෝග වැළකේ.

"කියන්න බලන්න කොහොමද හෝදන්නේ කියලා බබාගේ ආහාර දෙන උපකරණ. කොච්චරක් දෙනවද කිරි□ ඕක බලන්නම ඕනේ බොහෝ විට මේ බඩයෑම් හෝ රෝග කාරක එයින්ම සොයා ගත හැකිය.

"මේ බෝතලෙන් එකක් දෙනව මිස්." කියමින් ඇය එළියට ඇදගත් බෝතලය දුටු මට, හිත ඇතුලෙන් අනේ අපොයි කියැවිනි. මීයන් කා තිබූ වාටියත්, දරුණුවට හීරී තිබූ එළියත් ඇතුලත් අවපැහැයත් කියා පෑවේ මේ ජීවන ක්‍රමයේ ලක්ෂණයයි. හිත ඇතුලෙන් සුසුමන් රාශියක් නැගුනි.

දැන් මාස 8ක් තිස්සේ දරුවාට කිරි දෙන්නේ මෙයාකාරයෙනි. මේවා ලිව්ය යුත්තේ, අප මුහුණ දෙන්නේ මෙහෙම සමාජ ප්‍රශ්නවලට බව ඔබ දැනගත යුතු නිසා ය. මේ තරම් සංවේදනා වෙන කිසිම වෘත්තියක දකින්නේ දැනෙන්නේ නැතුවැති කියා මට සිතේ.

"කොහොමද මේවා හෝදන්නේ"
"මම උදේට තම්බලා දෙනවා, ඕත් දවස තිස්සෙම මේ එකම බෝතලේට කිරි දම දමා හදලා දෙනවා මෙයා. මම එනකම්ම" නැන්දම්මා කටහඬ අවදි කරයි.

"කොහොමද හෝදන්නේ" ඕවෙද්දිත් වටේ බැඳී තිබූ කුණු කහට නිසා ඇසුවෙමි.

"වැලි ටිකක් දාලා හොලවනවා"

"වැලි කොහෙන්ද ?" මම විස්මය සඟවාග නිමින් විමසුවෙමි. වෛද්‍යවරුන් ලෙස අපි කිසිවෙක් විනිශ්චය කරන සුළු වදන් නොකියන්නට වග බලා ගන්නෙමු.

"ගෙදරින් එළියේ බොරළු වැලි" ඇය මේ පවසන්නේ, නිතර ගංවතුර ගලන, ලෑලි පුරවරයේ ඇති මිදුල් ගැනය. තවත් ඔවුන් වෙහෙසා පලක් නැත. හෙටම මේ සඳහා පිළියමක් යෙදිය යුතුයි. ඇය දරුවාට කිරි දෙන්නේම නැත. කිරි නැති බව පවසයි. මාස අටක් තිස්සේ කිරි දීලාම නැත. දැන් මේ ප්‍රශ්නෙ ආපසු හරවන්න සෑහෙන්න අපහසුයි ඇය දැන් ආයෙත් ගැබිණියක් තවම දිනයක් හෝ මාසයක්වත් නොදන්නා ගැබිණි තත්වයක්.

රෝහලෙන් මවට දරුවාට අවශ්‍ය කෑම වේල සපයා දෙනු ලබනවා. ඇය ඕ ගමන්ම සායනයට යොමු කර ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරුන්ගේ උපදෙස් සහ ස්කෑන් මගින් දරුවා ලැබෙන දින නිර්ණය කරගත්තේද අප ඇය ඕවෙත යොමු කරගනිමිනි.

මේ කතා බහ යහළුවන් වෙත ලියා තැබූ විට ඔවුන් ද වහා වහා උදව් මා වෙත එව්වීය. මගේ නිවස පීරා අවශ්‍ය ආහාර බහාලුම්, ඇඳුම් සහ සපත්තු සොයා ගත්තෙමි. උදානි නංගී, හේෂිනී අක්කා, නිවී සහ ඉරූෂා අක්කා, තව බොහෝ දෙනෙක්ට දෙන්නට තරම් රෙදිපිළි ආහාර කිරි බහාලුම් සහ බොහෝ දේ අප වෙත එව්වී ය.

මේ අතර මේ කතාව ඇසූ මගේ බ්ලොග් සගයෙක් වන කිඹුලී හෙවත් ෂානු විජේතුංග

"අක්කේ මොනවද ඕනේ" කියමින් අසා ඇගේ යෙහෙළියක අතේ, මේ මවගේ ඊළඟ දරු ප්‍රසූතිය සඳහා අවශ්‍ය සියළුම දේ එවා තිබුනා. අපි ඕවා රැගෙන ගොස් ඇය නැවතී සිටි ප්‍රසව හා නාරිවේද වාට්ටුවේදි ඇයට ඕවා දුන්නා. ඇය සතුටු කඳුළු වගුරමින් ඕවා ලබා ගත්තා.

"අනේ ඩොක්ටර් ඕ අම්මා හරියට සතුටු වුනා" පහුවෙනිදා ප්‍රසව හා නාරිවේද වාට්ටුවේ මිස්ලා පැවසුවා.

අපි කරන්නේ මේවගේ තාවකාලික පැලැස්තර හොයලා අලවන එක. රෝගාබාද පොඩි කාලෙකට සුව කරන එක. එයාලා ආයෙම යන්නේ, ඔවුන් ඉන්නා මඩ ගොහොරුවට. ඡන්ද කාලෙට අපේක්ෂකයින්ට පේනා, යන එන ඕ ලෑලි ගෙවල් පුරවරයට, සෙසු කාලයට අනවසර ඉදිකිරීම් හෝ අනවසර පදිංචි වීම් යන ලේබලය ඇලවුණු, බන්ට් එකට එපිටින් ඇති ඕ මඩ ගොහොරුවට, ලයිට්වත් වතුරවත් නැති, එකමෙක පොදු කරාමයක් ඇති ඕ මු ඩුක්කුවට. ඔවුන්ගේ ජීවන අරගලය වෙනස් කරන්න හෝ, වඩා හොඳ ජීවන තත්වයක් ඇති කරන්න හැකිනම් මේ තාවකාලික පැලැස්තර වලට වඩා එය කොතරම් අගනේ දැයි මට සිතේ.

එතෙක් මගේ යෙහෙළියන්ට පින් දෙමින්, ස්තූති කරමින්, පරිත්‍යාග ලොග් පොතේ පිටු පිරෙමින් වාට්ටුව භාරයට පත්වූ ඕ සියළු දෑ, හෙද සොයුරියන් අතින් මේ අඩු ආදායම්ලාභී , දුෂ්කර පරිසර වල ඉන්නා අම්මලා වෙත ලබා දෙන්නෙමු.

